# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.02.01 පැය 1315 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/189/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## බොක්සිං තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

ශ්‍රී ලංකා බොක්සිං සංගමය මඟින් 97 වන වරට සංවිධානය කරනු ලැබූ 2024 ජාතික ශූරතා බොක්සිං තරඟාවලිය 2025.01.23 වන දින සිට 2025.01.26 දින දක්වා කොළඹ ගාලු මුවදොර පිටියේදී පවත්වන ලදි. මෙම බොක්සිං තරඟාවලියට දිවයින පුරා විසිරී සිටින බොක්සිං ක්‍රීඩා සමාජ 18 කින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 147 දෙනෙකු විවිධ බර පන්ති යටතේ සහභාගී විය. මෙම තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා පොලිස් බොක්සිං කණ්ඩායමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 12 දෙනෙකු සහභාගී වී රන් පදක්කම් 01 සහ ලෝකඩ පදක්කම් 05 ක් සමඟ ජයග්‍රහණ රැසක් හිමිකරගන්නා ලදි.

- පොලිස් කොස්තාපල් 92705 එච්.ඩබ්.ජී.පී රත්නසිරි 75kg-80kg - ප්‍රථම ස්ථානය
- සහයක සේවා උප පොලිස් පරීක්ෂක ජේ.කේ.පී.යූ. මිහිරාන් 48kg-51kg- වසරේ දක්ෂතම ක්‍රීඩකයා
- පොලිස් කොස්තාපල් 90870 ආර්.පවේන්ද්‍රන්- 67kg-71kg - තෙවන ස්ථානය
- පොලිස් කොස්තාපල් 106624 එච්.එම්.කේ.සී.ඒකනායක 60kg-63.5kg- තෙවන ස්ථානය
- කාන්තා පොලිස් කොස්තාපල් 9467 ජේ.ඒ.එස්.වයි. ජයසිංහ 81kg ඉහළ - තෙවන ස්ථානය
- කාන්තා පොලිස් කොස්තාපල් 12652 පී.එම්.එම්.ඒ. ගුණතිලක 48kg -50kg තෙවන ස්ථානනය
- කායවර්ධන සහායක ටී.එච්.එන්. ජිනදාස 46kg-48kg - තෙවන ස්ථානය

මෙම තරඟාවලියේ 2024 වසරේ ක්‍රීඩකයාට පිරිනමන කුසලානය පොලිස් බොක්සිං කණ්ඩායමේ ක්‍රීඩක සහයක සේවා උප පොලිස් පරීක්ෂක ජේ.කේ.පී.යූ.මිහිරාන් ක්‍රීඩකයා විසින් දිනා ගන්නා ලදි.

පොලිස් බොක්සිං කණ්ඩායමේ සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජගත් සේරම් මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස පොලිස් අධිකාරී මනෝජ් පෙරේරා මහතා කටයුතු කරයි. පුහුණුකරු ලෙස උප පොලිස් පරීක්ෂක සමීර කරුණාරත්න මහතා සහ කළමණාකරු ලෙස උප පොලිස් පරික්ෂක ලක්මාල් නිශාන්ත මහතා කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**








**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**